# දේශීය සංචාරකයින්ගේ තොරතුරු අවශ්‍යතා තෘප්තිමත් කිරීමෙහි ලා වෙබ් අඩවි වලින් ලැබෙන දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

එස්.පී.එස්. සන්දීපනී*

සංචාරක කර්මාන්තය වර්තමාන ආර්ථික කටයුතු අතර ප්‍රමුඛත්වයක් ගනු ලබන ක්ෂේත්‍රයකි. විදේශීය මෙන්ම දේශීය වශයෙන් ද සංචාරකයින්ගෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය සුවිශාල වේ. සංචාරකයින්ට සිය සංචාරය සාර්ථකව නිම කිරීමට නම් අත්‍යවශ්‍යම සාධකයක් ලෙස තොරතුරු හැඳින්විය හැක. එහිදී දේශීය සංචාරකයින්ට පවත්නා වූ තොරතුරු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අන්තර්ජාල වෙබ් අඩවි වලින් ලැබෙන දායකත්වය විමසීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. පර්යේෂණ ක්‍රමය වශයෙන් සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයවේදය භාවිත කරන ලදී. වෙබ් අඩවි තුළින් බොහෝ දුරට සපුරාලනු ලබන්නේ විදේශීය සංචාරකයින්ගේ තොරතුරු අවශ්‍යතා පමණි. දේශීය සංචාරකයින් සඳහා අන්තර්ජාල වෙබ් අඩවි තුළින් ලබාදෙන්නේ සීමිත තොරතුරු ප්‍රමාණයකි. එම නිසා දේශීය සංචාරකයින් සිය දෙනෙකු නියැඳිය වශයෙන් යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි. ව්‍යුහගත ප්‍රශ්නාවලියක් හා ඉලක්කගත කණ්ඩායමක් සාකච්ඡාවට භාජනය කරන ලදී. මෙමගින් දේශීය සංචාරකයින්ගේ තොරතුරු අවශ්‍යතාවයන් ස්ථිතික නොවන බවත්, කාලය අනුව එම අවශ්‍යතාවයන් වෙනස් වන බවත්, එම අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වෙබ් අඩවි යාවත්කාලීන නොවන බවත් හෙළි විය. සංචාරක ස්ථාන සොයා ගැනීමේ දී භාෂාමය ගැටලු හේතුවෙන් වෙබ් අඩවි භාවිතයේ දී දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවන බව ද හඳුනාගත හැකිවිය. නව තාක්ෂණය සම්බන්ධයෙන් පවත්නා නොදැනුවත්භාවය ද තොරතුරු සමුද්ධරණයට පවතිනා බාධාවකි. සංචාරක තොරතුරු ප්‍රචාරණයට එය බලපා තිබේ. සංචාරක තොරතුරු වෙබ් අඩවි තුළ විධිමත්ව සංවිධානය නොකිරීම තුළින් අවශ්‍ය තොරතුරු පමණක් ලබා ගැනීම දුෂ්කර වී ඇත. සංචාරකයින් බොහෝ දෙනෙකුගේ අදහස වූයේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අන්තර්ජාල වෙබ් අඩවිවල දායකත්වය සතුටුදායක නොවන බවයි. එබැවින් දේශීය සංචාරකයින් සඳහා නිවරදි තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවි යාවත්කාලීන කිරීමත් භාෂා කිහිපයකින් ම තොරතුරු අන්තර්ගත කිරීමත් සිදු කළ යුතුව ඇත. තොරතුරු සංවිධානය කිරීමේ දී දේශීය සංචාරකයින් පිළිබඳව ද විශේෂ අවධානය යොමු කළ යුතු අතර වෙබ් අඩවි ප්‍රචලිත කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අවශ්‍ය බවට යෝජනා කෙරේ.

ප්‍රමුඛ පද - සංචාරක කර්මාන්තය, දේශීය සංචාරකයින්, තොරතුරු, තොරතුරු අවශ්‍යතා, වෙබ් අඩවි

* පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය pssandeepani@gmail.com